# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 03 යි

## 10 ශ්‍රේණිය – 2019 – පළමුවාර පරීක්ෂණය

### I කොටස

**සැලකිය යුතුයි :-**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමය වන්නේ,
   (1) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයයි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
   (3) ඍජු ප්‍රතාන්ත්‍රවාදයයි. (4) ඍජු හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
2. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවති බවට ඉතිහාසයෙන් තොරතුරු හමුවන්නේ,
   (1) මගධ ජනපදයේ ය. (2) වජ්ජි ජනපදයේ ය. (3) කෝසල ජනපදයේ ය. (4) මල්ල ජනපදයේ ය.
3. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය ලෙස දැක්වෙන්නේ,
   (1) පුරවැසි සභාව යි. (2) විධායක සභාව යි. (3) පාර්ලිමේන්තුව යි. (4) රාජාණ්ඩුව යි.
4. ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකට නිදසුනකි,
   (1) චීනය (2) ඉන්දියාව (3) ඇමරිකා එක්සත් ජනපදය (4) රුසියාව
5. සමාජය ක්‍රමයෙන් දියුණු වීමත් සමග සංවිධානාත්මක පාලන ක්‍රමයක් අවශ්‍ය වූයේ,
   (1) වාර්ගික ගැටුම් ඇති නොවීම සඳහාත් ජන සමාජයේ යහපැවැත්ම සඳහාත් ය.
   (2) නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහාත් වාර්ගික ගැටුම් ඇති නොවීම සඳහාත් ය.
   (3) ජන සමාජයේ යහ පැවැත්ම සඳහාත් තම අවශ්‍යතා සපුරා ගැනීමේ පහසුව සඳහාත් ය.
   (4) ජන සමාජයේ යහ පැවැත්ම සඳහාත් නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහාත් ය.
6. ක්‍රි:පූ: 5 වන සියවස සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවතියේ,
   (1) ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය කි. (2) ධනේෂ්වර ක්‍රමය කි.
   (3) වැඩ වසම් ක්‍රමය කි. (4) රදළ ආණ්ඩු ක්‍රමය කි.
7. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වැදගත් ලක්ෂණයක් වන්නේ,
   (1) සමාජ සුභසාධන කටයුතු කෙරෙහි විශේෂ අවධානයකින් කටයුතු කිරීම ය.
   (2) පුරවැසියන්ගේ ජීවන තත්වයේ ගුණාත්මකභාවය ගැන නොසැලකීම ය.
   (3) වැඩිහිටියන්ගේ රැකවරණය පිළිබඳ ව දැඩි ලෙස අවධානය යොමු නොකිරීම ය.
   (4) අධ්‍යාපනය හා සෞඛ්‍ය පිළිබඳව පමණක් රජය අවධානය යොමු කිරීම ය.
8. "ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි" යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,
   (1) සීලර් ය. (2) ඒබ්‍රහම් ලින්කන්ය. (3) ශබ්දකෝෂය ය. (4) A.V. ඩයිසි ය.
9. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රථමයෙන් ආරම්භ වූ රට වන්නේ,
   (1) ඉතාලිය යි. (2) බ්‍රිතාන්‍යය යි. (3) ග්‍රීසිය යි. (4) ප්‍රංශය යි.
10. ශ්‍රී ලංකාවේ බෙදා ඇති මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව වන්නේ,
    (1) 21 කි. (2) 22 කි. (3) 24 කි. (4) 25 කි.
11. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයක් නොවන්නේ,
    (1) මැතිවරණ නීති රීති වලට අනුකූල මැතිවරණයක් පැවැත්වීම ය.
    (2) සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම ය.
    (3) රටේ සියළුම ජනතාවට ඡන්දය ලබා දීමට අවස්ථාව සැලසීම ය.
    (4) නියමිත කාලය තුළ මැතිවරණය පැවැත්වීම ය.
12. සර්ව ජන ඡන්ද බලය මගින් පාලකයන් තෝරාගනු ලබන්නේ,
    (1) ජනාධිපතිවරයා විසිනි (2) අගමැතිවරයා විසිනි
    (3) ඡන්ද අපේක්ෂකයන් විසිනි (4) ඡන්ද දායකයන් විසිනි
13. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ දී සීමානිර්ණය සඳහා යොදා ගනු ලබන්නේ,
    (1) ජනගහණය පමණි. (2) භූමිය හා ජනගහණයයි. (3) භූමිය පමණි. (4) ජනවර්ගයයි.
14. මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක අයත් වන්නේ පහත කුමන මැතිවරණ දිස්ත්‍රික්කයට ද?
    (1) වන්නි (2) යාපනය (3) කොළඹ (4) ත්‍රිකුණාමලය

papers.lk

15. යුරෝපයේ ජාතික රාජ්‍ය බිහිවීමට හේතුවක් නොවන්නේ,
(1) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණය යි. (2) කාර්මික විප්ලවයයි.
(3) වැඩ වසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් බිහිවීමයි. (4) පුනරුදයයි.

16. ආණ්ඩුවක ප්‍රධානම අවයවය වන්නේ,
(1) විධායකය, අධිකරණය හා ප්‍රාන්ත ආණ්ඩුවයි
(2) ව්‍යවස්ථාදායකය, රාජ්‍යසේවය හා පළාත් පාලනය යි
(3) ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යි
(4) විධායකය, පළාත්පාලනය හා අධිකරණය යි

17. රටක ව්‍යවස්ථාදායකයට අයත් කාර්යයකි,
(1) නීති සම්මත කිරීමෙන් බැහැර වීම (2) මුදල් පාලනයට සම්බන්ධ නොවීම
(3) විධායකය පාලනය කිරීමට මැදිහත් නොවීම (4) නීති ක්‍රියාවට නැංවීම

18. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කර ගනු ලැබූ වර්ෂය වන්නේ,
(1) 1948 දෙසැම්බර් 13 (2) 1948 දෙසැම්බර් 10
(3) 1948 මාර්තු 20 (4) 1948 පෙබරවාරි 04

19. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක කාණ්ඩය වන්නේ.
(1) කොළඹ / කළුතර / මන්නාරම (2) කොළඹ / කළුතර / කුරුණෑගල
(3) කොළඹ / කළුතර / ගම්පහ (4) කොළඹ / කළුතර / ගාල්ල

20. අධිකරණය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යය කුමක්ද?
(1) යුක්තිය පසඳලීම ය. (2) නීති සකස් කිරීම ය.
(3) රටක සාමය ආරක්ෂා කිරීම ය. (4) ජනාධිපතිවරයා පත්කර ගැනීම ය.

21. උත්කෘෂ්ට විප්ලවය හඳුන්වන තවත් නමකි,
(1) ප්‍රංශ විප්ලවය (2) රුසියානු විප්ලවය (3) කාර්මික විප්ලවය (4) ඉංග්‍රීසි විප්ලවය

22. රටේ යහපාලනයක් ගොඩ නැගීම සඳහා දායකත්වය ලබා දීමට හැකියාවක් ලැබෙනුයේ,
(1) දේශපාලකයන්ට ය (2) පළාත් ආණ්ඩුකාරවරුන්ට ය
(3) බුද්ධිමත් ඡන්ද දායකයාට ය (4) රටේ ජනතාවට ය

23. 'පෞර රාජ්‍ය' යන්නෙන් අදහස් කරනුයේ,
(1) විශාල පවුරකින් වට වූ රාජ්‍යය කි (2) නගරයක් කේන්ද්‍ර කොටගත් පාලනය කි
(3) රජකෙනෙකු කරනු ලැබූ පාලනය කි (4) පැරණි රාජධානිය කි

24. ඉංග්‍රීසි විප්ලවය නිසා ඇති වූ වැදගත් ප්‍රතිඵලය කි,
(1) කාන්තාවන්ට ඡන්ද බලය හිමි වීම ය. (2) රජතුමාගේ බලය තව තවත් වර්ධනය වීම ය.
(3) පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම ය. (4) විදේශිකයන්ට ද ඡන්ද බලය හිමි වීම ය.

25. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටවල නියෝජිතයන් තෝරා ගනු ලබන්නේ,
(1) පවුල් පසුබිම මත ය (2) උගත්කම මත ය
(3) ධනවත්භාවය මත ය (4) සර්ව ජන ඡන්ද බලය මත ය

26. රටක දේශපාලන බලය ලබා ගැනීම පිණිස තරඟකාරී පක්ෂ කීපයක් ඉදිරිපත් වන්නේ,
(1) ඒක පක්ෂ ක්‍රමය මගිනි (2) බහු පක්ෂ ක්‍රමය මගිනි
(3) ද්වි පක්ෂ ක්‍රමය මගිනි (4) ප්‍රතිපක්ෂ ක්‍රමය මගිනි

27. ක්‍රි:ව: 15 වන සියවසෙන් පසු යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් වන්නේ,
(1) ප්‍රංශය හා බ්‍රිතාන්‍යයි (2) එංගලන්තය හා ප්‍රංශයයි
(3) ජර්මනිය හා ප්‍රංශයයි (4) ඉතාලිය හා ප්‍රංශයයි

28. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
(1) කථානායක ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි (2) ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි
(3) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි (4) සභානායක ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි

29. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා තෝරා පත්කරනු ලබන්නේ,
(1) ජනමත විචාරණය මගින් ය (2) සර්වජන ඡන්ද බලය මගින් ය
(3) පාර්ලිමේන්තු මැතිවරණය මගින් ය (4) ජනාධිපතිවරණය මගින් ය

papers.lk

30. ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමේ ප්‍රධාන කුළුන ලෙස සැලකිය හැක්කේ,
(1) පොලීසිය යි (2)අධිකරණය යි (3) පාර්ලිමේන්තුව යි (4) විධායකය යි
31. මැතිවරණයක දී ආණ්ඩු පක්ෂයට වඩා අඩු නියෝජිත සංඛ්‍යාවක් තේරී පත්වූ පක්ෂය හෝ පක්ෂ හඳුන්වනු ලබන නාමය වන්නේ,
(1) ආණ්ඩු පක්ෂය යි (2) විරුද්ධ පක්ෂය යි (3) දේශපාලන පක්ෂය යි (4) ප්‍රතිවිරුද්ධ පක්ෂය යි
32. මහජනතාව සතු දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,
(1) අධ්‍යාපනය ලැබීමේ අයිතිය යි. (2) කැමති ආගමක් ඇදහීමේ අයිතිය යි.
(3) සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය යි. (4) ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය යි.
33. නිදහස් හා සාධාරණ මැතිවරණයක දී,
(1) ඡන්ද දායකයන්ට බලපෑම් කරන දේශපාලන බලවේග තිබේ.
(2) දූෂණ හා වංචා බහුල වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ බහුල වේ.
(4) රාජ්‍ය බලතල වැඩියෙන් පාවිච්චි කරනු ලැබේ.
34. "ප්‍රජාව" යනු යම් සමාජයක ජීවත් වන ජනතාව ලෙස හැඳින්විය හැකිය. "තන්ත්‍රය" යනුවෙන් ප්‍රකාශ වන්නේ,
(1) ආණ්ඩුව යි (2)පාලන ක්‍රමය යි (3) ජනාධිපතිවරයා යි (4) ජන සමාජය යි
35. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකිය හැකි රට වන්නේ,
(1) මහා බ්‍රිතාන්‍යය යි (2) ග්‍රීසිය යි (3) ප්‍රංශය යි (4) ස්විස්ටර්ලන්තයි
36. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,
(1) බහුවිධතාව තුළින් එක්සත් බවක් ගොඩනැගීමට නොහැකි වීම ය.
(2) අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම ය.
(3) ආණ්ඩු පක්ෂයේ ප්‍රතිපත්ති විවේචනය කිරීමට නොලැබීම ය.
(4) ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාවක් නැති වීම ය.
37. රටක මූලික නීතිය කුමක්ද?
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ය (2) විධායක ය (3) අධිකරණ ය (4) ව්‍යවස්ථාදායක ය
38. ජාතික රාජ්‍ය යුරෝපයේ ඉස්මතු වන්නේ කුමන කාල වකවානුවේද ?
(1) 15 වන සියවසේ දී ය. (2) 15 වන සියවසට පෙර ය.
(3) 15 හා 16 වන සියවස් අතරේ දී ය. (4) 15 වන සියවසෙන් පසුව ය.
39. ජාතික රාජ්‍යයන් පිළිබඳ සංකල්පය ශක්තිමත් කළ දේශපාලන චින්තකයා මින් කවරෙක්ද?
(1) ජෝන් ඔස්ටින් ය (2) T.H. ග්‍රීන් ය (3) නිකොලොයි මැකියාවේලි ය (4) G. මාෂල් ය
40. පුරවැසියෙකු සතු යුතුකම් වර්ග 2 වන්නේ,
(1) නීතිමය යුතුකම් හා සාමය රැකීම.
(2) නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් ය.
(3) සදාචාරාත්මක යුතුකම් හා සමානාත්මතා මූලධර්ම ය.
(4) නීතිමය යුතුකම් හා සමානාත්මතා මූලධර්මය.

papers.lk

# පුරවැසි අධ්‍යාපනය
# 10 ශ්‍රේණිය – 2019 – I වාරය
## II කොටස

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.**

01. (1) නූතන රාජ්‍යයන්හි දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම 2 ක් ලියන්න.
(2) රටක බුද්ධිමත් දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීමේ ප්‍රයෝජන 2 ක් ලියන්න.
(3) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියාට භුක්ති විඳීමට ඇති අයිතිවාසිකම් 2 ක් සඳහන් කරන්න.
(4) අතීතයේ සිට ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරීමට යොදා ගත් පාලන ක්‍රම වලින් 2 ක් සඳහන් කරන්න.
(5) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිබඳ අදහස් දැක් වූ චින්තනයන් දෙදෙනෙකු නම් කරන්න.
(6) සප්ත අපරිහානි ධර්ම 2 ක් ලියන්න.
(7) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යභාරයන් 2 ක් ඉදිරිපත් කරන්න.
(8) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් මාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්ය භාරයන් 2 ක් ලියන්න.
(9) රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ 2 ක් ලියන්න.
(10) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප 2 ක් ලියන්න. (1x10=20)

02. (1) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න. (ල:2)
(2) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල:3)
(3) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ 3 ක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)

03. (1) පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් 2 ක් සඳහන් කරන්න. (ල:2)
(2) අනාගත පුරවැසියෙකු වශයෙන් ඔබෙන් රටට ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න. (ල:3)
(3) පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් 3 ක් ලියා ඉන් එකක් පිළිබඳව විස්තරයක් ලියන්න. (ල:5)

04. (1) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමේ දී ඔබතුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 2 ක් සඳහන් කරන්න. (ල:2)
(2) ලොව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පවතින රටවල් 3 ක් නම් කරන්න. (ල:3)
(3) ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාර 3 ක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල:5)

05. (1) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතුවිය යුතු වැදගත් ගුණාංග 2 ක් ලියන්න. (ල:2)
(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක පුරවැසියන්ට ලැබෙන දේශපාලන අයිතීන් 3 ක් ලියන්න. (ල:3)
(3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක තිබෙන වැදගත්කම් 3 ක් ලියා ඉන් එක් වැදගත්කමක් පිළිබඳව ඔබේ අදහස් ලියා දක්වන්න. (ල:5)

06. (1) පුරවැසියකු සතු සදාචාරාත්මක යුතුකම් දෙකක් ලියන්න. (ල:2)
(2) පුරවැසියකු සතු යුතුකම් පිළිබඳව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තියේ දක්වා ඇති යුතුකම් 3 ක් සඳහන් කරන්න. (ල:3)
(3) ආණ්ඩුව තම පාලන කටයුතු පවත්වා ගෙන යාමේ දී ජන සමාජයට ඉටු විය යුතු වගවීම 3 ක් සඳහන් කර ඉන් එක් වගවීමක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)

07. (1) ජනාධිපති ආණ්ඩුක්‍රමය පිළිබඳව ප්‍රකාශයක් කර ඇති විද්වතාගෙ නාමය සඳහන් කරන්න. (ල:2)
(2) පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවක දී තෝරා ගන්නා තනතුරු 3 ක් සඳහන් කරන්න. (ල:3)
(3) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ 3 ක් සඳහන් කර ඉන් එකක් පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල:5)

papers.lk